(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 13(9).]

# පාර්ලිමේන්තුවේ අංක 13 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා

## 2015 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5092/'14

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ දී, ශ්‍රී ලංකා රජය විසින් උගන්ඩා රජය වෙත යම් මූල්‍යමය ආධාර කිරීමක් හෝ ව්‍යාපෘති සඳහා ආධාර කිරීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(iii) එම රට වෙත යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලබා දී තිබේ නම්, එම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(iv) එම මූල්‍ය ආධාර හෝ ව්‍යාපෘති ආධාර ලබා දීමේ අරමුණ කවරේද;

(v) ශ්‍රී ලංකා රජය විශාල විදේශ ණය ප්‍රමාණයක් ගෙවීමට තිබිය දී, ඉහත පරිදි වෙනත් රටකට ආධාර ලබා දීම නිශ්ඵල ක්‍රියා මාර්ගයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5774/'14

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මතුගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, හොරවල උප කාර්යාල සීමාව තුළ හොරවල, දියකිතුලගොඩවත්ත, මතුගම - අළුත්ගම පාරට මුහුණලා පිහිටි අමරපාල ජයනෙත්ති මහතාට අයත් පර්චස් 2.8ක කුඩා ඉඩමේ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වූ සැලැස්ම අනුමතකර ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසු අවට නිවෙස්වලට ගමන් කරන මාර්ගයට හා අසල ඉදිකර ඇති ගොඩනැගිලිවලට අවහිරතා ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම රජයේ නීති රීති අනුව සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ගොඩනැගිලි සැලැස්මට අනුමතිය ලබා දී ඇති ක්‍රියා පිළිවෙත කවරේද;

(iii) එම අනුමතිය කිනම් පාර්ශ්වයක අවශ්‍යතාවය මත සිදු කර තිබේද;

(iv) රජයේ නීති රීති අනුව නිවසක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අවසරය ලබා දීම සඳහා තිබිය යුතු අවම බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 අප්‍රේල් මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5424/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවේ පුහුණු ශිල්පී මූලික සේවා ව්‍යවස්ථාවට අනුව, 1997.01.01 දින සිට සියලුම පුහුණු ශිල්පීන් එම සේවාවට අන්තර්ග්‍රහණය කර ඇති බව දන්නේද;

(ii) වෙනත් කිසිදු සේවා ව්‍යවස්ථාවක නොමැති කොන්දේසියක් ලෙස මෙම සේවාවේ කාණ්ඩ සහ උසස්වීම අනුව "අ" කාණ්ඩයේ සිටින ශිල්පීන්ට පළමුවැනි පන්තිය සඳහා උසස්වීම් ලබාදීමේදී 6:1 අනුපාතය අනුගමනය කරනු ලබන්නේද;

(iii) එම අනුපාතය 6/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී වෙනස් කරන බවට අවස්ථා කීපයකදී බලධාරීන් විසින් එකඟ වී ඇති බව දන්නේද;

(iv) නමුත්, මේ වනතුරුත් 6/2006 චක්‍රලේඛය අනුව උසස්වීම් පටිපාටියක් සකස් කිරීමට අපොහොසත්වී තිබේද;

(v) එසේ නම්, එයට හේතු කවරේද;

(vi) මෙම ගැටලුව නිසා වැටුප් වර්ධක උපරිම සීමාවේ රැඳී සිටින විශාල සේවක පිරිසකට ද අසාධාරණයක් සිදුවන බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5448/'14

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2009 සිට 2013 දක්වා පස් වසරක කාල සීමාව තුළ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් උපයන ලද ලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය මගින් පවත්වාගෙන යන ලොතරැයි වර්ග කවරේද;

(ii) පසුගිය වාරයේ දිනුම් අදින ලද මෙගා ලොතරැයිය පිළිබඳව ප්‍රචාරය කළ පරිදි, පළමු දිනුමට රුපියල් කෝටි 5කුත්, සෙසු තෑගි ලෙස ජීප් රථ 40කුත් දිනුම් ඇදීමෙන් පසු ජයග්‍රාහකයන්ට ලබා දුන්නේද;

(iii) මේ වන විට සෙසු එක් එක් ලොතරැයිය දිනුම් ඇද ප්‍රකාශයට පත් කරන දිනුම් සංඛ්‍යාව හා ප්‍රදානය කරන ලද ත්‍යාග මුදල අඩු කර තිබේද;

(iv) එසේ අඩු කර ඇත්නම්, එහි සංඛ්‍යාත්මක අගය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5846/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ, අංක R/0682/T/036 යටතේ ලියාපදිංචි ජුම්ආ දේවස්ථානයට අවසන්වරට නීත්‍යානුකූලව භාරකරුවන් පත්කරන ලද දිනය කවරේද;

(ii) එම භාරකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් දේවස්ථානයට අයත් නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේපලවලට අයත් හිමිකම්පත් (ඔප්පු) දේවස්ථානය නමින් තිබේද;

(iii) එම එක් එක් දේපළ කුලී පදනම මත හෝ බද්දට ලබාදීමේදී වකුෆ් පනතේ සඳහන් විධිවිධාන පරිදි ගිවිසුම් අත්සන් කර තිබේද;

(iv) එසේ නම්, එම ගිවිසුම් අත්සන් කළ දින සහ අදාළ බදුකරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් එක් එක් දේපළ, බදු හෝ කුලී පදනම යටතේ ලබාදීම සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ අනුමතිය ලබාදී තිබුණේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5858/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වන විට රට තුළ දෛනිකව භාවිතා කරන ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් යන ඉන්ධන වර්ගවල සාමාන්‍ය අගය ලීටර් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් ඉන්ධන වර්ගය සඳහා දැනට අයකරන බදු ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි කාලය තුළ ජනතාවට සහනයක් ලැබෙන පරිදි එකී බදු ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ අනුව එම එක් එක් ඉන්ධන ලීටරයක් සඳහා නියමිත වෙළඳපොළ මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5890/'15

ගරු ලසන්ත අලගියවන්න මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, දිවයින පුරා ඇති මාර්ගයන්හි දුර කිලෝමීටර කොපමණද;

(ii) එම මාර්ග අතරින් 2015.01.01 දින වන විට අංග සම්පූර්ණ ලෙස සංවර්ධනය කර තිබූ මාර්ගවල දුර ප්‍රමාණය කොපමණද;

(iii) තවදුරටත් සංවර්ධනය කිරීමට ඇති මාර්ගයන්හි මුළු දුර කිලෝමීටර් කොපමණද;

(iv) සංවර්ධනය කිරීමට නියමිතව තිබෙන මාර්ග ඉදිරියේදී සංවර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5897/'15

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධිශ්‍රේණි තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසයේ, සීතාවකපුර නව අධිශ්‍රේණි තැපැල් කාර්යාලය සඳහා ගොඩනැගිලි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, එම අධිශ්‍රේණි තැපැල් කාර්යාලය එළැඹෙන සිංහල අලුත් අවුරුද්දට පෙර ජනතා අයිතියට පත් කොට සේවාවන් සැපයීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අවිස්සාවේල්ල තැපැල් බල ප්‍රදේශය, සීතාවක තැපැල් බල ප්‍රදේශය ලෙස නම් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඉහත (අ) (ii) හි සඳහන් තැපැල් කාර්යාලය විවෘත කිරීමත් සමග අදාළ බල ප්‍රදේශය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5859/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය කාල වකවානුව තුළ අප රටේ අධ්‍යාපන පද්ධතිය තුල පුළුල් වෙනසක් සිදු වූ බවත්;

(ii) මේ වන විට ද්විතියික පාසල් 1000ක් හා ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට ඉදිකර ඇති මහින්දෝදය විද්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එකී විද්‍යාගාර අතරින් සිසු අයිතියට පත්කර ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ඉතිරි මහින්දෝදය විද්‍යාගාර කඩිනමින් සිසු අයිතියට පත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 අප්‍රේල් මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5118/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුකුලේගඟ විදුලි බලාගාරයෙහි තිබෙන විදුලි උත්පාදන යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් යන්ත්‍රයෙහි විදුලි උත්පාදන ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂය මුළුල්ලේ ඉහත සඳහන් සියලු විදුලි උත්පාදන යන්ත්‍ර ක්‍රියාත්මකව පැවතියේද;

(ii) නොඑසේ නම්, අක්‍රියව පැවති යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් යන්ත්‍රය අක්‍රියව තිබූ කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම විදුලි උත්පාදන යන්ත්‍ර අක්‍රියවීමට හේතු කවරේද;

(v) අනාගතයේදී එම බලාගාරයේ යන්ත්‍ර අක්‍රිය නොවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5500/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ එක් සේවකයෙකුට අවම වශයෙන් රු 96,000/- ක හා උපරිම වශයෙන් රු. 265,000/- ක වන්දි මුදලක් ගෙවා 1990.03.31 දින සිට එම ආයතනය වසා දමන බව එවකට පැවති රජයේ විෂය භාර අමාත්‍යවරයා විසින් 1990.03.23 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බවත්;

(ii) එසේ ප්‍රකාශ කළත්, එම සේවකයින්ට ගෙවා ඇත්තේ රු. 50,000/- ක මුදලක් පමණක් බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ඉතා අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවය කළ ඉහත සඳහන් සේවක පිරිසට ඉතිරි වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එවකට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සතුව පැවති නිල නිවාසවල අයිතිය, එම අවස්ථාවේ එහි පදිංචිව සිටි සේවකයින්ට ලබා දෙන බවටත්, නිවාස නොමැති සෙසු සේවකයින්ට ඉඩම් ලබා දෙන බවටත් කළ ප්‍රකාශය අනුව, මේ වන විට සියලුම සේවකයින්ට නිවාස හෝ ඉඩම් ලබා දී අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එම නිවාස හෝ ඉඩම් සඳහා මේ වන විට හිමිකම් ඔප්පු ලබා දී අවසන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5847/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ, අංක R/0682/T/036 යටතේ ලියාපදිංචි ජුම්ආ දේවස්ථානයේ නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) පරිහරණයේදී සිදුවී යැයි කියන දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශණයක් සිදු කරන්නේද;

(ii) එම දේවස්ථානයට අයත් දේපළවලින් ලැබෙන ආදායම හා වැය ශේෂය සම්බන්ධයෙන් විශේෂිත නව භාරකාර මණ්ඩලයක් යටතේ විගණනය කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වකුෆ් දේපළ පරිහරණයේදී වංචා සහගත ලෙස පුද්ගල නමින් ඔප්පු සකස් කොට පවරන ලද දේපළ තිබේද;

(ii) එසේ නම්, එවැනි දේපළ තහනම් කිරීමටත්, අදාළ පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමටත් උපදෙස් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5865/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ ජනතාවගෙන් බහුතරයක් බත් ආහාරයට ගන්නා බවත්;

(ii) ඒ අනුව රට තුළ සහල් සඳහා විශාල ඉල්ලුමක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහල් මිල පහත හෙලීම සඳහා ගනු ලබන කඩිනම් ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5894/'15

ගරු ලසන්ත අලගියවන්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල් පද්ධතිය සඳහා අවශ්‍යවන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ පාසල් තුළ 2015.01.01 දිනට සිටි ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගුරු අතිරික්තයක් හෝ ගුරු ඌනතාවයක් පවතී නම්, ඊට අදාළ විස්තර කවරේද;

(iv) ගුරු ඌනතාවයක් පවතින්නේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5898/'15

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසයේ, සීතාවකපුර නගර සභා බල ප්‍රදේශයේ, පිලිප් ගුණවර්ධන ක්‍රීඩා සංකීර්ණයේ දෙවැනි අදියර වූ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීම මේ වන විට අවසන්කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රීඩා මණ්ඩපය ජනතා අයිතියට පවරන දිනය කවරේද;

(iii) එම ක්‍රීඩා සංකීර්ණයේ දෙවැනි අදියර ජනතා අයිතියට පැවරීමෙන් පසුව එහි සංවර්ධන හා නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා සීතාවකපුර නගර සභාව විසින් කර ඇති ඉල්ලීමට අනුව එම ක්‍රීඩා සංකීර්ණය එකී නගර සභාව වෙත පැවරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5904/'15

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අතුරු අයවැය මගින් වී කිලෝග්‍රෑම් 1ක් සඳහා රු. 50.00ක ස්ථාවර මිලක් ලබාදීමට යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම යෝජනාව 2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන මාසය හා දිනය කවරේද;

(iii) එම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී සෑම වී කිලෝග්‍රෑමයක්ම ඉහත සඳහන් මිලටම මිලදී ගන්නා ලෙස සියලුම වී මිලදී ගැනීමේ ආයතනවලට හා පෞද්ගලික ගැනුම්කරුවන්ට නියම කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නියම කරන ලද ස්ථාවර මිලට වී මිලදී නොගන්නා අයට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5914/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.23 හෝ ආසන්න දිනක රාත්‍රී මොරවැව, මහදිවුල්වැව II පියවරේ පිහිටි ශ්‍රී ඉන්ද්‍රාරාම මහා විහාරස්ථානය පොලිසිය විසින් හදිසි පරීක්ෂාවකට ලක්කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විහාරස්ථානයෙහි වැඩ සිටින නිකායික කාරක සංඝ සභික හා සම්මානනීය සංඝ සභික පූජ්‍ය පොල්හේන්ගොඩ උපරතන නාහිමිපාණන්වහන්සේගේ ආරක්ෂකයින්ගේ නිවාස ද පරීක්ෂාවට ලක්කිරීමේ අරමුණ කවරේද;

(ii) ඉහත පරීක්ෂාවන් සඳහා අවසර දුන් අය කවුරුන්ද;

(iii) එම පරීක්ෂාව සඳහා සහභාගී වූ නිලධාරීන් කවුරුන්ද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 'යහපාලනය' ප්‍රතිපත්තිය මත වත්මන් රජය පත්වීමෙන් පසුව පොලිසියේ හෝ වෙනත් ආරක්ෂක අංශයකට අයත් නිලධාරීන්ගේ පරීක්ෂාවන්ට ලක්කර ඇති බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම විහාරස්ථානයන්හි නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පරීක්ෂාවන්ට ලක් කිරීමේ අරමුණ කවරේද;

(iv) එම අරමුණු ඉටු වී තිබේද;

(v) පරීක්ෂාවට ලක්කරන ලද විහාරස්ථාන අතරින් නඩු පවරන ලද විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vi) ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5867/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රාදේශීය රාජ්‍ය පාලනය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන ප්‍රාදේශීය ලේකම්වරයා තම කොට්ඨාසය තුළ නේවාසිකව සිටීම රාජකාරි කටයුතු සඳහා වඩාත් යෝග්‍ය වන බවත්;

(ii) අවශ්‍ය නේවාසික පහසුකම් නොමැතිකම හේතුවෙන් දීර්ඝ කාලයක සිට අලව්ව ප්‍රාදේශීය ලේකම්වරයාට තම කොට්ඨාසය තුළ නේවාසිකව සිටීමට නොහැකිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අලව්ව ප්‍රාදේශීය ලේකම්වරයාට තම කොට්ඨාසය තුළ නේවාසිකව සිටීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5120/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 / 2014 වර්ෂවලදී විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර 60 ක් ඉදිකිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යම් ආයතන හා ගිවිසුම්ගත වී තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම්වලට අදාළව ගිවිසුම් ඇති කර ගත් ආයතන කවරේද;

(iii) එම ඉදිකිරීම් ආයතන තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටි අනුගමනය කරනු ලැබුවේද;

(iv) නොඑසේ නම්, එම ආයතන තෝරා ගැනීමට පාදක කරගත් කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් ආයතනයට ඉදිකිරීමට ලබා දී ඇති නේවාසිකාගාර සංඛ්‍යාව සහ එම ඉදිකිරීම්වලට අදාළව ගිවිසුම්ගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් ගිවිසුම්කරු විසින් නේවාසිකාගාර ඉදිකිරීම අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(iii) ඉදිකරනු ලබන එක් එක් නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් ලබාදීමට හැකි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5848/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, මහ නගර සභා බල ප්‍රදේශයේ, අංක 32, කුප්පියාවත්ත බටහිර කොට්ඨාසයට අයත්, මාළිගාකන්ද පටුමග, වරිපනම් අංක 59 සහ 59/8 දරන ස්ථානය අසලින් ඇති ප්‍රවේශ මාර්ගයේ අනවසර ඉදිකිරීමක් කර තිබීම නිසා ප්‍රදේශවාසීන්ට නොයෙකුත් බාධා සිදු වෙමින් පවතින බව දන්නේද;

(ii) කොළඹ මහ නගර සභාවේ ඇතැම් නිලධාරීන්ගේ අනුග්‍රහය මත සිදු කර ඇති එකී නීති විරෝධී ඉදිකිරීම් ඉවත් කොට පදිංචිකරුවන්ගේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5868/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට ඛනිජ තෙල් ආනයනය කිරීමේදී විදේශ රටවලට විශාල මුදලක් ගෙවීමට සිදුවන බව දන්නේද;

(ii) එසේ නම්, සියලුම ඉන්ධන වර්ග ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල ආසන්න වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට අයත් ගොඩබිම හෝ මුහුදු සීමාව තුළ තෙල් නිධි ඇති බවට කර ඇති ප්‍රකාශවල සත්‍යතාවයක් තිබේද;

(ii) එසේ නම්, එම තෙල් නිධි පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම තෙල් නිධි කැනීමට මේ වන විට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5905/'15

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අතුරු අයවැය මගින් රබර් කිලෝග්‍රෑම් 1 ක් සඳහා රු. 350.00ක ස්ථාවර මිලක් ලබා දීමට යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, 2015 වර්ෂය තුළදී එම යෝජනාව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන මාසය හා දිනය කවරේද;

(iii) එම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී සෑම රබර් කිලෝග්‍රෑමයක්ම ඉහත සඳහන් මිලටම මිලදී ගන්නා ලෙස සියලුම රබර් මිලදී ගැනීමේ ආයතනවලට නියම කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නියම කරන ලද ස්ථාවර මිලට රබර් මිල දී නොගන්නා ආයතනවල හිමිකරුවන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) ලෝක වෙළඳපොළේ සිදුවන රබර් මිල අඩුවීමට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ රබර් මිල අඩුවන අවස්ථාවන්හි දී ඉහත සඳහන් ස්ථාවර මිලට රබර් මිල දී ගැනීම හේතුවෙන් රබර් ගැනුම්කරුවන්ට සිදුවන අලාභය පියවා ගැනීම සඳහා සහනාධාර ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම සහනාධාර ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) සහනාධාර ලබා දීමට අමතරව එකී ගැනුම්කරුවන්ට ලබා දෙන වෙනත් සහන තිබේද;

(v) එම සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5915/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශිෂ්ට පරිපාලනයක් තුළින් ත්‍රිකුණාමලය ශ්‍රී ලංගම ඩිපෝවෙහි ආදායම් ඉහළ නැංවීමට කටයුතු කළ එහි කළමනාකාර විජිත ධර්මසේන මහතාට අසභ්‍ය වචනයෙන් බැන ඔහුගේ සේවා ස්ථානයෙන් පලවා හැර ඇති බවත්;

(ii) ප්‍රවාහන විෂය අයත් නොවන ඇමතිවරයෙකුගේ සෘජු මැදහත්වීමක් මත දේශපාලන හේතු මත එම බැන වැදීම හා පළවා හැරීම සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සිදුවීමට අදාළව අමාත්‍යාංශ මට්ටමේ පරීක්ෂණයක් පවත්වා අගතියට පත් එම ඩිපෝ කළමනාකරුට සාධාරණයක් ඉටුකරන්නේද;

(ii) 2015 ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීමෙන් පසු මේ වන තෙක් අයුතු බලපෑම් හෝ වෙනයම් ක්‍රමවේද මගින් තනතුරුවලින් පහ කර හෝ බිය ගැනීම් කර සේවය අතහැර ගියා සේ සලකන තත්ත්වයට පත් කර ඇති ශ්‍රී ලංගම ඩිපෝ කළමනාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, දුරකතන අංක හා අදාළ ඩිපෝවල නම් කවරේද;

(iv) එම අකටයුතුකම් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර සහ ඉදිරියට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5574/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය සඳහා කොටුව දුම්රිය ස්ථානයේ ප්‍රධාන භෝජනාගාරය පවත්වාගෙන යාමට අදාළව ටෙන්ඩර් කැඳවීමක් කළේද;

(ii) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ ටෙන්ඩර්කරුවෝ කවුරුන්ද;

(iii) එම එක් එක් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත ටෙන්ඩර්කරුවන් අතරින් අදාළ කටයුත්ත සඳහා තෝරා ගත් ටෙන්ඩර්කරු කවුරුන්ද;

(v) එම තෝරා ගැනීම සිදු කළ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම භෝජනාගාරය පවත්වා ගෙන යනු ලබන අය කවුරුන්ද;

(ii) එම තැනැත්තාට එකී භෝජනාගාරය පවත්වා ගෙන යාමට අවස්ථාව ලබා දුන් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5849/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1995 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ ආරම්භ කරන ලද අරාබි භාෂාව සහ ඉස්ලාමීය ශිෂ්ටාචාරය ඉගැන්වීමේ අංශයේ කථිකාචාර්ය, ලිපිකරු සහ ලිපිකරු සහායක යන තනතුරු සඳහා පුරප්පාඩු පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5869/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට මෙරට සිටින ස්ථිර නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිවාස නොමැති පවුල් සඳහා නිවාස ලබා දෙන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5912/'15

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අතුරු අයවැය මගින් අමු තේ දළු කිලෝග්‍රෑමයකට රු. 80.00ක ස්ථාවර මිලක් ලබා දීමට යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම යෝජනාව 2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන මාසය හා දිනය කවරේද;

(iii) එම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී සෑම අමු තේ දළු කිලෝග්‍රෑමයක්ම ඉහත සඳහන් මිලටම මිලදී ගන්නා ලෙස සියලුම තේ කර්මාන්තශාලාවලට නියම කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නියම කරන ලද ස්ථාවර මිලට තේ දළු මිල දී නොගන්නා තේ කර්මාන්තශාලා හිමිකරුවන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) ලෝක වෙළඳපොළේ සිදුවන තේ මිල අඩුවීමට සාපේක්ෂව මෙරට තේ මිල අඩුවන අවස්ථාවන්හි දී ඉහත සඳහන් ස්ථාවර මිලට තේ දළු මිලදී ගැනීමෙන් තේ කර්මාන්තශාලා හිමියන්ට සිදුවන අලාභය පියවා ගැනීම සඳහා සහනාධාර ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම සහනාධාර ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) සහනාධාර ලබා දීමට අමතරව, එකී කර්මාන්තශාලා හිමියන්ට ලබා දෙන වෙනත් සහන තිබේද;

(v) එම සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?